# හාමුදුරුවෝ හා අයියා

සිංහල සංස්කෘතිය තුළ වර්ගීකරණය කෙරී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය තුළ වර්ගීකරණය කෙරෙන අන්දමට නොවේ. බෙහෙත් පැළ සම්බන්ධයෙන් අපි මෙය සඳහන් කෙළෙමු. එහෙත් අද බටහිර සංස්කෘතික යටත්විජිතවාදයෙහි ප්‍රතිඵලයක් ලෙස ශාඛ පිළිබඳ ව අපේ වූ වර්ගීකරණය, එනම් ශාඛ අනෙක් දැයින් වෙන්කර ගත් වස්තු ලෙස ගෙන නොව ශාඛ බෙහෙත් ලෙස මිනිසුන්ට සහ සතුන්ට වැදගත් වන්නේ කෙසේ ද යන්න මත පදනම් ව කරන ලද වර්ගීකරණය අමතක කර, ආයුර්වේද හා සිංහල වෙදකම් සම්බන්ධයෙන් ද ටැක්සොනොමි වර්ගීකරණය යොදාගනු දක්නට ලැබෙයි. බටහිර උද්භිද විද්‍යාවෙහි දී කෙසේ වෙතත් වෙදකමේ දී අප කළ යුතු වන්නේ අපේ වර්ගීකරණය තව දුරටත් හදාරා එය වැඩි දියුණු කර ගැනීම ය. එහෙත් බටහිර සංස්කෘතික අධිරාජ්‍යවාදය එයට ඉඩක් නොදෙයි. එහි තේරුම නම් අප බටහිර සංස්කෘතික යටත්විජිතවාදයට යට වී සිටීම ය.

අප කරුණු ඉදිරිපත් කරමින් සිටියේ භාෂාව ගැන ය. මෙහි දී අප සඳහන් කළ ප්‍රධාන ම කරුණ වූයේ භාෂාව යනු මිනිසාගේ නිර්මාණයක් බව ය. භාෂාව යනු තරමක් වියුක්ත වූවකි. කතාකරන භාෂාවට වඩා ලියන භාෂාව වියුක්ත වෙයි. කතාකරන භාෂාවෙහි ඉඟි බිඟි පෑ හැකි නමුදු, ස්වරය වෙනස් කළ හැකි නමුදු, අතින් සංඥා කළ හැකි නමුදු, ලියන භාෂාවෙහි මේ කිසිවක් කළ හැකි නොවේ. භාෂා අතර ද වියුක්ත බවින් අඩු වැඩි වූ භාෂා ඇත. චීන භාෂාව, අඩුම තරමින් එහි ලියන බස, අක්ෂර මාලාවක් ඇති සිංහල වැනි භාෂාවකට වඩා සංයුක්ත වෙයි. චීන භාෂාවෙහි අකුරක් සිංහලයෙහි තරමට වියුක්ත ව නොලියැවෙයි. භාෂාව නිර්මාණය කිරීමට පෙර මිනිසුන් වෙනත් සන්නිවේදන මාධ්‍ය නිර්මාණය කර ඇත. සංගීතය, චිත්‍රකලාව ආදිය ඒ සඳහා උදාහරණ වෙයි. භාෂාවක් නිර්මාණය වන්නේ යම් සංස්කෘතියක් තුළ ය. භාෂාවක් නැතිව වුව ද සංස්කෘතියක් නිර්මාණය කළ හැකි ය. සංස්කෘතියක් නිර්මාණය කිරීමට හා පවත්වා ගෙන යෑමට අවශ්‍ය වන්නේ සන්නිවේදන මාධ්‍යයකි. මෙහි දී සන්නිවේදන මාධ්‍යයක් යනුවෙන් හැඳින්වෙන්නේ ජෛවීය නොවන්නා වූ ද අදාළ සත්ත්ව වර්ගයා විසින් නිර්මාණය කෙරෙන්නා වූ ද, සන්නිවේදන ක්‍රමයකි. ඉඟි බිඟි පෑම වුව ද සන්නිවේදන මාධ්‍යයකි. හස්ත මුද්‍රාව, චිත්‍ර, සංගීතය ආදී මේ සියල්ල සන්නිවේදන මාධ්‍ය ලෙස ද සැලකිය හැකි ය.

මිනිසුන්ට හැරෙන්නට පොළොව මතුපිට ජීවත්වන අනෙක් සතුන්ට සංස්කෘතියක් ඇත් ද නැත් ද යන ප්‍රශ්නයට බටහිර විද්‍යාවේ නිශ්චිත පිළිතුරක් දිය නොහැකි ය. එහෙත් ඇතැම් පරයේෂණ මගින් හෙළිවන්නේ ඇතැම් සත්ත්වයනට අඩුම තරමින් සංස්කෘතිකාංග ඇති බව ය. වෙනත් ග්‍රහලෝකවල ජීවත්වන ඇතැම් සතුන්ට සංස්කෘතියක් ඇතැයි විශ්වාස කළ හැකි ය. සංස්කෘතියක් ඇති සත්ත්වයෝ තම සංස්කෘතිය ඊළඟ පරම්පරාවට සන්නිවේදනය කරති. සත්ත්ව වර්ගයකට ඊළඟ පරම්පරාවට සන්නිවේදනය නොකර සංස්කෘතියක් පවත්වා ගෙන ගිය හැකි නොවේ. ජෛවීය වශයෙන් ද සත්ත්වයෝ ඇතැම් ගති ලක්ෂණ ඊළඟ පරම්පරාවට උරුම කර දෙති. එහෙත් එසේ උරුම කර දෙන්නේ ඒ ලක්ෂණ කියා දීමෙන් නොවේ. ඒ ලක්ෂණ ඊළඟ පරම්පරාවට උරුම වන්නේ ජාන මගිනි. සංස්කෘතික ලක්ෂණ එලෙස ජෛවීය ව, ජාන හෝ වෙනත් ක්‍රමයකින් හෝ උරුම නොකෙරෙයි. සංස්කෘතික ලක්ෂණ හා ජෛවීය ලක්ෂණ අතර ඇති මේ වෙනස අප තේරුම් ගත යුතු ය. මෙයට අමතරව සත්ත්වයකුගේ ලක්ෂණ සාංසාරිකව ද නිර්ණය වන බව අවධාරණය කළ යුතු ය.

මිනිස් වර්ගයාගේ විවිධ පවුල් (කුලක) තුළ සංස්කෘතීන් ඇරඹුණේ කෙසේ දැයි අපි නොදනිමු. එහෙත් සංස්කෘතියක් ඇති වීමට භාෂාවක් පැවතීම අනිවාර්ය නොවේ. අප මේ කරුණ වටහා ගත් විගස බටහිර පශ්චාත්නූතනවාදීන්ගේ අදහසක් වන මිනිසා භාෂා නිර්මිතයක් ය යන්නෙහි බොළඳ බව වැටහෙයි. ඒ ඒ මිනිසුන්ට ඒ ඒ භාෂා තිබීම ද මෙහි දී මේ කසිකබල් පශ්චාත්නූතනවාදී මතයට එරෙහිව ඉදිරිපත් කළ හැකි ප්‍රබල සාධකයකි. විවිධ භාෂා නිර්මාණය කෙරී ඇත්තේ මිනිසුන් විසිනි. මිනිසා භාෂා නිර්මිතයක් නම් විවිධ භාෂා ගොඩ නැගෙන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිලිතුරක් සපයන්නේ කෙසේ ද? භාෂාව විසින් මිනිසා නිර්මාණය කෙරිණි ය යන්නට වඩා මිනිසුන් විසින් භාෂා නිර්මාණය කෙරිණි ය යන්න තර්කානුකූල ය.

© Prof. Nalin De Silva

බටහිර පශ්චාත්නූතනවාදීන්ට මේ පටලැවිල්ල සිදුවන්නේ ඔවුන්ගේ ඒක රේඛීය චින්තනය නිසා ය. අප රටේ අනුකාරක පශ්චාත්නූතනවාදීන්ට එවැනි පටලැවිල්ලක් නැත. අනුකාරකයනට මොන පටලැවිලි ද? ඔවුන් දන්නේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදය ඉදිරියේ දීන ලෙස වැඳ වැටී යටත්විජිතවාදී මතවාද හීනමානයෙන් අනුකරණය කිරීම පමණකි. ඔවුහු තමන් පටලැවී ඇති බවක් හෝ නොදනිති. බටහිරයන්ට පටන් ගන්නා තැනක් අවශ්‍ය වෙයි. මිනිසා භාෂා නිර්මිතයක් යැයි ඔවුන් පවසන්නේ එබැවිනි. මිනිසුන් යම් ප්‍රමාණයකට භාෂාව විසින් මෙහෙයවනු ලබන බව පැහැදිලි ය. එහෙත් ඉන් කියැවෙන්නේ මිනිසා භාෂා නිර්මිතයක් ය යන්න නොවේ.

චක්‍රීය චින්තනය තුළ මේ ප්‍රශ්නය පැන නොනගියි. මිනිසා විසින් නිර්මාණය කරනු ලැබූ භාෂාවෙන් යම් යම් මති මතාන්තර සන්නිවේදනය කෙරෙයි. ඒ ඇතැම් සන්නිවේදන ඔස්සේ අපට අප ජීවත්විය යුත්තේ කෙසේ ද යන්න පිළිබඳව ද අඟ ලැබෙයි. එහෙත් එය භාෂාවේ නොව සංස්කෘතියේ ලක්ෂණයකි. අප ජීවත්විය යුත්තේ කෙසේද යන්න අපට කියා දෙන්නේ සංස්කෘතියයි. ඒ කරුණු සන්නිවේදනය කිරීම සඳහා අද බොහෝ විට භාෂාව උපයෝගී කර ගැනෙයි. මිනිසා භාෂා නිර්මිතයක් නොව සංස්කෘතික නිර්මිතයක් යැයි කීවේ නම් එයට වඩා වැදගත් කමක් ලැබෙනු ඇත. එහෙත් එවැනි සූත්‍රගත කිරීමක් වුව ද නිවැරදි නොවේ. මෙවැනි සූත්‍රගත කිරීම් නිවැරදි නොවනවා පමණක් නොව නිර්ණන (ඩිටර්මිනිස්ටික්) ද වෙයි. මේ නිර්ණය කිරීම පිළිබඳ වාදය නියතිවාදය (ඩිටර්මිනිසම්) නම් වෙයි.

ක්වොන්ටම් භෞතිකය හා තාප ගතිකය හැරෙන්නට මුළු මහත් බටහිර විද්‍යා දැනුම් සම්භාරය ම නියතිවාදය තුළ බිහි වී ඇත. එනම් බටහිර සම්භාව්‍ය භෞතික විද්‍යාව ලෙස හැඳින්වෙන නිව්ටෝනීය භෞතික විද්‍යාව හා සාපේක්ෂතාවාදය නියතිවාදයට යට වෙයි. එපමණක් නොව බටහිර අනෙක් දැනුම් ද නිර්ණන වෙයි. මේ යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයෙහි ප්‍රතිඵලයකි. නියතිවාදයට අනුව මුල් කරුණු (එකක් හෝ කිහිපයක්) දැනගත් විට ඒ ඇසුරෙන් අනෙක් සියළු දැනුම් නිගමනය (අපෝහනය - ඩෙඩ්‍යුස්) කළ හැකි ය. මෙය එක් පැත්තකින් ගත්කල ග්‍රීක ස්වසිද්ධි මූලක (ඇක්සියොමැටික්) ක්‍රමය මත පදනම් වී ඇත. යුක්ලීඩීය ජ්‍යාමිතිය මේ සඳහා හොඳම උදාහරණය වෙයි. එහි ස්වසිද්ධි හෙවත් ප්‍රත්‍යක්ෂ (ඇක්සියම්ස්) දැනගත් විට ඇරිස්ටෝටලීය තර්කය යොදා ගනිමින් සියළු ප්‍රමේය ලබාගත හැකි ය.

උදාහරණයක් ලෙස නිව්ටෝනීය ගතිකය ගනිමු. එහි චලිත නියම යොදා ගනිමින් ඕනෑම වස්තුවක හෝ අංශුවක හෝ මුල් අවස්ථාව (පිහිටීම හා ප්‍රවේගය, මේ අගයන්ට මායිම් අගයන් - බවුන්ඩ්‍රි වැලූස් යැයි ද කියනු ලැබේ) දන්නේ නම් ඕනෑම කාලයකට පසුව ඒ වස්තුවෙහි හෝ අංශුවෙහි හෝ පිහිටීම හා ප්‍රවේගය ගණනය කිරීමෙන් දැනගත හැකි ය. මෙය දෙවියන් වහන්සේ සියල්ල දනියි යන යුදෙව් ක්‍රිස්තියානි ආකල්පය මත ද පදනම් වෙයි. අප සියල්ලන්ගේ ම දෛවය කලින් ම තීරණය වී ඇත යන්න ද මේ සමග බැඳී ඇත. මේ සම්බන්ධ ප්‍රසිද්ධ කියමන ලප්ලාස් නම් ප්‍රංශ විද්‍යාඥයා කර ඇතැයි සඳහන් වෙයි. ඔහු කියා ඇත්තේ දෙවියන් වහන්සේ ලෝකාරම්භයෙහි දී ග්‍රහයන් මැවූ ආකාරය (පිහිටීම හා ප්‍රවේගය) දන්නේ නම් අපට ග්‍රහ වස්තුවල ඉදිරි චලිතය මුළුමනින් ම කිව හැකි බව ය. මේ නියතිවාදයට පහරක් වැදුණේ අනාගතය ගැන සම්භාවිතා අගයන් ඉදිරිපත් කළ තාප ගතිකයෙන් හා ක්වොන්ටම් භෞතිකයෙනි.

මිනිසා භාෂා නිර්මිතයක් නැත්නම් සංස්කෘතික නිර්මිතයක් යැයි කීමෙන් අදහස් කරන්නේ කුමක්දැයි අපි දැන් තේරුම් ගනිමු. බටහිර පශ්චාත්නූතනවාදීන්ට අනුව නම් අප හැසිරිය යුතු අන්දම භාෂාව මගින් තීරණය වෙයි. සමාජයක වැඩි හිටියන්ට සැලකිය යුතු යැයි ආකල්පයක් ඇත්නම් එය කියා දෙන්නේ භාෂාව යොදා ගනිමිනි. සමාජයේ ස්ත්‍රීන්ට හිමි තැන අපට තේරුම් කර දෙන්නේ ද භාෂාවෙනි. මේ සියල්ලට ම වඩා භාෂාවක වචනවලට නිශ්චිත අරුත් ඇත. අප නොදැනුවත්ව ම, එනම් අවිඥානිකව ම, අපි මේ අරුත් ලබා ගන්නෙමු. අයියා හෝ අක්කා හෝ යන්න හුදෙක් වැඩිමහල් සොහොයුරකු හෝ සොහොයුරියක හෝ හඟවන පදයක් නොවේ. එහි එයට වඩා සැඟවුණු දෙයක් ඇත. අප අයියාට ගරු කළ යුතු බව ද අයියා යන වචනය අප යොදා ගැනීමේ දී අපට කියා දී ඇත. අප කටයුතු කරන්නේ ජීවත් වන්නේ මෙවැනි සැඟවුණු අරුත් ද යොදා ගනිමිනි. සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ හාමුදුරුවන් යනු ගරු කළ යුතු අපෙන් වැඳුම් පිදුම් ලබන අයෙකි. මහාචාර්ය ජී බී දිසානායක මහතා පෙන්වා දී ඇති ආකාරයට සිංහල භාෂාවේ එක් හාමුදුරු නමකට වුව ද අප යොදා ගන්නේ හාමුදුරුවෝ යන බහු වචනය යි. හාමුදුරුවෝ, රජ්ජුරුවෝ ආදී

© Prof. Nalin De Silva

පදවලට ඒකවචන රූප නැත. ඒ වචන ගෞරවාර්ථයෙහි බහුවචනයෙන් ම යෙදෙයි. ඒ තුළ හාමුදුරුවන්ට මෙන් ම රජ්ජුරුවන්ට ද ගරු කළ යුතු බව සිංහල බෞද්ධයන්ට කියා දෙනු ලැබෙයි.

එහෙත් මේ සියල්ලෙන් කියැවෙන්නේ මිනිසා භාෂා නිර්මිතයක් බව ද? භාෂාව නිර්මාණය වන්නේ සංස්කෘතියක් තුළ ය. අප හාමුදුරුවන්ට ගරු කරන්නේ සිංහල බෞද්ධ සංස්කෘතිය තුල ය. ඒ වචන එලෙස නිර්මාණය කර ගන්නේ ම අප අදාළ සංස්කෘතික පදනමක සිටින බැවිනි. එබැවින් අප භාෂා නිර්මිතයක් යැයි කීම නම් මුළුමනින් ම වැරදි ය. එසේ නම් මෙයින් කියැවෙන්නේ අප සංස්කෘතික නිර්මිත බව ද? අප නිර්මාණය කරනු ලැබ ඇත්තේ සංස්කෘතිය විසින් ද? කිසිසේත් ම නැත. සංස්කෘතිය යනු අපට වෙනත් කවුරුත් හෝ දුන් දෙයක් නොවේ. යුදෙව් ක්‍රිස්තියානි සම්ප්‍රදාය තුළ මිනිසා ද ඇතුළු සියල්ල දේව නිර්මාණ වුව ද, අපේ සංස්කෘතිය තුළ දේව සංකල්පය ද මිනිසාගේ නිර්මාණයකි.

මිනිසා භාෂා නිර්මිතයක් ය, සංස්කෘතික නිර්මිතයක් ය ආදී අදහස් පිටුපස ඇත්තේ සියල්ල බාහිර බලයක, බලවල ක්‍රියාකාරීත්වය මත රඳා පවතින්නේ ය යන යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ය. නිව්ටෝනීය ගතිකය ද බිහි වී ඇත්තේ මේ චින්තනය තුළ ම බව කලින් ද සඳහන් වී ඇත. අංශුවක හෝ වස්තුවක හෝ චලිතය වෙනස් කරන්නේ බාහිර බලයක් මගින් යැයි පළමු චලිත නියමයෙන් ම ඉගැන්වෙයි. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය තුළ ම බිහි වු මාක්ස්වාදයෙහි දේව නිර්මාණය නැතැයි කසිකබල් මාක්ස්වාදියකු විසින් කියනු ලැබීමට ඉඩ ඇත. මාක්ස්වාදයෙහි දෙවියන් වහන්සේ නැත්තේ භෞතික වශයෙන් යැයි කිව හැකි ය. එහෙත් ආත්මීය වශයෙන් දෙවියන් වහන්සේ ඇත. ඒ දෙවියන් වහන්සේ අන්කිසිවක් නොව ආර්ථිකය ය. සියල්ල ආර්ථිකය විසින් හැසිරවෙන්නේ ය, සියල්ල ආර්ථිකය මත පදනම් වී නිර්ණය වන්නේ ය ආදී අදහස් මාක්ස්වාදයෙහි වෙයි. නිව්ටෝනීය භෞතික විද්‍යාව, මාක්ස්වාදය, පශ්චාත්නූතනවාදය ආදී බටහිර දැනුම් නියතිවාදය, ඒක රේඛීය චින්තනය ආදිය ආත්මකොට ගත්තේ වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva